ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

<u>**ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට බේලි පාලම් තොගයක් හාර දේ**</u>

ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ ආර්ථික සහ වාණිජ අංශයේ පළමු ලේකම්තුමා විසින් අද දින ටොන් 214ක බේලි පාලම් තොගයක් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා සහ ආපද කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන් වෙත භාර දෙන ලදී. මෙම පාලම් තොගය 2026 පෙබරවාරි 24 වන දින විශාඛාපට්නම් සිට කොළඹට ළඟා විය.

2. මෙම බේලි පාලම් තොගය ඉන්දියාවේ විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මැතිතුමා විසින් දිට්වා සුළි කුණාටුවෙන් අනතුරුව සිදු කල ශ්‍රී ලංකා සංචාරය අතරතුරදී නිවේදනය කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන 450ක පුළුල් නැවත ඉදිකිරීමේ සහ පුනරුත්ථාපන පැකේජයේ කොටසකි.

3. බේලි පාලම් ශ්‍රී ලංකාව පුරා ස්ථාන රැසක ස්ථාපනය කරනු ඇත. ඒ සදහා තාක්ෂණික ඇගයීම් ශ්‍රී ලංකා යුධ හමුදාවේ සහ මාර්ග සංවර්ධන අධිකාරියේ සමීප සම්බන්ධීකරණයෙන් ඉන්දීය යුධ හමුදාවේ ඉංජිනේරුවන් විසින් සිදු කරනු ලැබේ.

4. මෙයට පෙර ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට බේලි පාලම් හතරක් ලබා දුන් අතර ඉන් දෙකක් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ද අනෙක පාලම් දෙක මහනුවර-රාගල මාර්ගයේ ද ස්ථාපනය කරන ලදී. මෙම පාලම් අභියෝගාත්මක ප්‍රදේශවල මාර්ග සම්බන්ධතාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම, ප්‍රදේශයේ ජනතාවට මාර්ග පහසුකම් සැලසීම සහ අත්‍යවශ්‍ය සේවා සහ ආර්ථික ක්‍රියාකාරකම් නැවත ආරම්භ කිරීමෙහිලා වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත.

5. ඉන්දියාව යටිතල පහසුකම් යළි ගොඩනැගීම, සම්බන්ධතාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ බලපෑමට ලක් වූ ප්‍රදේශවල ප්‍රජාවන් සඳහා සහයෝගය ලබා දීම හරහා ශ්‍රී ලංකාව යළි යථා තත්ත්වයට පත් වීමට ගන්නා ප්‍රයත්නයන් සමඟ අඛණ්ඩව රැඳී සිටියි.

****

**කොළඹ**

***2026* පෙබරවාරි *27***